## දරුවන් උදෙසා බයිබලයක්

# ගඟෙන් ගොඩගත් කුමාරයෙක්



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: M. Maillot; Lazarus Alastair Paterson

සකස්කරන්නා: M. Maillot; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ආණ්ඩුකාර ජෝසෙප් මිය ගියේය. මුළු ඊජිප්තු වැසියන්ම ඔහුගේ පවුලේ සාමාජිකයන් සමඟ දුක බෙදා ගත්තෝය. දෙවියන්වහන්සේ ඒ දේශය සාගතයෙන් බේරාගන්නට හෙබ්‍රෙව්



ජාතික ජෝසෙප්ව යොදාගත් සේක. ඔහු ඥානවන්ත මෙන්ම ආදරණීය නායකයෙකු වූයේය. දැන් ඔහු නැත.

අවුරුදු තුන් සීයයක දිගු කාලයක් ගතවිය. ජෝසෙප් ගේ ජනතාව වූ හෙබ්‍රෙව්වෝ ඊජිප්තුව පුරා මහත් ජාතියක් බවට පත් වූවෝය. අලුත් ඵාරාවෝ, යම් දවසකදී හෙබ්‍රෙව්වන් ඔහුට විරුද්ධව නැඟී සිටීවියැයි සිතා ඔවුන් කෙරෙහි බියවී, ඔවුන් සියලු දෙනා වහලුන් බවට පත් කළේය.



ඵාරාවෝ හෙබ්‍රෙව් ජනතාවට දුෂ්ඨ ලෙස සැළකුවේය. ඔහු ඔවුන්ට විශාල නගර ඉදි කරන්නට බල කළේය. නමුත් මොනතරම් ඔහු ඔවුන්ට පීඩා කළත් හෙබ්‍රෙව් වහලුන් බෝ වී වැඩීම දිගටම සිදුවිය.



එක් දිනක් ඉතා භයානක අණක් ඵාරාවෝ වෙතින් නික්මුණි. “අලුත ඉපදුන සියලුම හෙබ්‍රෙව් පිරිමි දරුවන් නයිල් ගඟට විසිකළ යුතුය.” ඵාරාවෝ හෙබ්‍රෙව් ජනතාව අඩු කරන්නට තීරණය කළේය. බිළිඳු දරුවන් පවා මරා දමන්නට ඔහු මැළි නොවීය.



“අපට කළ හැක්කේ කුමක්ද?” එක් පවුලක් එසේ සිතන්නට ඇත. ඔවුහු තමුන්ගේ දරුවා නයිල් ගඟට දමන්නට තීරණය කළෝය. නමුත් ඒ දරුවා වතුර කාන්දු නොවන ආරක්ෂිත කූඩයක් තුල හිදිනු ඇත.



ඒ කුඩා කූඩය එහි තුල වූ වටිනා දේ ද රැගෙන, ගඟ දෙපස වැවුනු පඳුරු අතරින් පාවී ගියේය. කුඩා දරුවට කුමක් වේවිද?



පඳුරු අතරින් කූඩය, වතුරේ ඉහළ පහළ යන අයුරු කුඩා බිළිඳාගේ සහෝදරිය දුරින් හිඳ බලා සිටියාය.



හදිසියේම ඵාරාවෝ ගේ දුව ඇයගේ සේවිකාවන්ද සමඟ ගඟේ නාන්නට ආවාය. කූඩය සැඟවීමට ක්‍රමයක් නොතිබුණි. සමහරවිට ඔවුන් එය නොදැක එය පසුකර යනු ඇත.



“ආ.. කූඩයක්. අර අතන
පඳුරු අස්සේ. ඒ තුල
කුමක් ඇද්ද?” ඵාරාවෝ
ගේ දුව එය රැගෙන එන
ලෙස ඇයගේ සේවිකාවට
අණ කළාය. ඇය එය
විවෘත කළ විට කුඩා
බිළිඳා හැඬුවේය.
“හෙබ්‍රෙව් දරුවෙක්”
කුමරිය කෑගැසුවාය.



“අසරණ දරුවා. ඔබ හරිම ලස්සනයි” වැඩිහිටියන් කතා කරන විදියටම ඵාරාවෝගේ දියණියද ඒ බිළිඳා ට කතා කරන්නට ඇති. ඇය ඊජිප්තු භාෂාවෙන් ඔහුව සුරතල් කරන්නද ඇති.



දෙවියන් වහන්සේ විසින් බිළිදාගේ සොහොයුරියට විශේෂ නුවණක් දුන්නා විය හැකිය. ඇය ඵාරාවෝ දියණිය වෙතට දිවගියාය. “මම ඔබ වෙනුවෙන් බිළිදා බලාගන්නට හෙබ්‍රෙව් කාන්තාවක් ගෙන එන්නද?” ඇය ඇසුවාය.
“රැගෙන එන්නයැ” යි පිළිතුරු ලැබිණි. ඔබ සිතන පරිදි ඇය දිවගියේ කවුරුන් රැගෙන එන්නද?



“අම්මා! ඉක්මනින් එන්න. ඉක්මන් කරන්න”
සමහරවිට දැරියට කරුණු පැහැදිලි කරන්නට
වේලාවක්ද නොතිබුනා
විය හැකිය. දෙදෙනාම
වේගයෙන් අඩිපාර
දිගේ දිවගියෝය.



ගඟ අසළදී ඵාරාවෝ ගේ දුව දරුවා ඇය දෙසට දිගු කළාය.
“මා වෙනුවෙන් ඔහු බලාගන්න. මම ඔබට ගෙවන්නම්. ඔහුට
මෝසෙස් යනුවෙන් කතා කරන්න.” “මෝසෙස්” යනු
සමහරවිට ඊජිප්තු භාෂාවෙන්
“ජලයෙන් ගත් පුත්‍රයා”
විය හැකිය.



මෝසෙස් නැවත තම දෙමව්පියන් හා
නිවස වෙත පැමිණියේය. ඔවුහු ඔහුට
දෙවියන් වහන්සේටත් හෙබ්‍රෙව්
මිනිසුන්ටත් ආදරය කරන්නට
ඉගැන්නුවේය.
ඉක්මනින්ම ඔහු
ඵාරාවෝ ගේ දුව
සමඟ මාළිගාවේ
ජීවත් වනු ඇත.
ඔහුගේ ජීවිතය
බේරාගත් දෙවියන්
වහන්සේට බිළිඳු
මෝසෙස් ගේ
අනාගතය ගැන
විශාල සැලැසුමක්
තිබුණි.



# ගඟෙන් ගොඩගත් කුමාරයෙක්

## දේව වචනයෙන් එක් කථාවක්

## බයිබලයේ

## නික්මයාම 2

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත.
ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)